031

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 03 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය 2022/ 2023**

**සාධාරණත්වය හා භාර නීතිය- LLU3505**

**කාලය - පැය තුන (03) යි.**

---

**දිනය : 2024 මාර්තු 06** **වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30**

---

**මුළු ප්‍රශ්න ගණන : 08**

**I කොටසින් ප්‍රශ්න දෙකක් (02) හා II කොටසින් ප්‍රශ්න තුනක් (03) ද ඇතුළුව මුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**අපේක්ෂකයන්ගේ අපහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.**

**I කොටස - සාධාරණත්වය**

**මෙම කොටසින් ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න.**

1. "සාධාරණත්වය නීතියේ කොටසක් නොවන නමුත් නීතියේ තද, දෘඩ සහ තියුණු තැන් යෝග්‍ය කරන, නව්‍යකරණය කරන සහ ප්‍රතිසංස්කරණය කරන සදාචාරාත්මක ගුණධර්මයක් වන අතර එය විශ්වීය සත්‍යයකි; තවද නීතිය දෝෂ සහිත සහ දුර්වල අවස්ථාවන්හිදී එය නීතියට සහාය වේ......"

   ~*Dudley V. Dudley* (1705) Perc Ch 241;24 ER 118.~

   ඉංග්‍රීසි නීතිය තුළ සාධාරණත්වයේ ස්වභාවය සහ වර්ධනය අනුසාරයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

   **(ලකුණු 20)**

2. (අ). පද්මාට, පෞරාණික වටිනාකමින් යුතු රත්‍රන් ආලේපිත පිත්තල භාණ්ඩ කිහිපයක් පරම්පරාවෙන් උරුමව ඇත. පිත්තල භාණ්ඩ තරමක් අවපැහැගැන්වී තිබූ බැවින්, ඒවා නැවත රත්‍රන් ආලේපනය පිණිස රන් ආලේපකරුවෙකු වන ජුවානිස්හට ලබා දෙන ලදී. ඔහු රන් ආලේපිත පිත්තල භාණ්ඩ සති 02 ක් ඇතුළත පද්මාට ලබා දෙන බවට මුලින් එකඟ විය. නමුත්, දැන් ජුවානිස් පද්මාව මගහරිමින් සිටින අතර ඔහු පිත්තල භාණ්ඩ ඇයට ආපසු ලබා නොදෙනු ඇතැයි ඇය තුළ බියක් හට ගෙන ඇත.

   පද්මාට අයදුම් කළ හැකි සාධාරණත්ව ප්‍රතිකර්ම ඇසුරින් ඇයට උපදෙස් දෙන්න.

(ආ). *"Raymond Industries (PVT) Ltd"* ගාල්ලෙහි පිහිටි ප්‍රසිද්ධ ඇඟලුම් කර්මාන්තශාලාවකි. එය සේවකයන් 2500 කට ආසන්න පිරිසකට රැකියා අවස්ථා සපයන අතර සෑම වසරකම විශාල විදේශ විනිමයක් ශ්‍රී ලංකාවට රැගෙන එනු ලබයි. කර්මාන්තශාලාවට යාබද ඉඩම අක්කර 05 ක් පමණ වන කළුගල් බහුල ඉඩමක් වේ. එම ඉඩම කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහසින් පීටර් විසින් මිළට ගෙන ඇත. *"Raymond Industries (PVT) Ltd"* හි හිමිකරු වන පියල්හට එය දැනගැනීමට ලැබී ඇත. පීටර් එම ඉඩම තුළ කළුගල් කැඩීම ආරම්භ කළහොත් එමඟින් කර්මාන්තශාලාවේ සේවකයන්ට දරාගත නොහැකි ඝෝෂාවක් සහ සෞඛ්‍යමය අනතුරක් සිදු වේ යැයි පියල් තුළ බියක් හට ගෙන ඇත.
පියල්ට අයදුම් කළ හැකි සාධාරණත්ව ප්‍රතිකර්ම අනුසාරයෙන් ඔහුට උපදෙස් දෙන්න.

**(10 x 2 = ලකුණු 20)**

3. පහත ආප්තයන්, ඒවායේ මූලික ලක්ෂණ සහ නූතන අධිකරණ ක්‍රියාදාමය තුළ ඒවායේ භාවිතය ඇසුරින් පැහැදිලි කරන්න. ඔබේ පිළිතුර උචිත නඩු තීරණ ඇසුරින් තහවුරු කරන්න.
(අ). සාධාරණත්වය පතන්නා පිරිසිදු දෑතින් පැමිණිය යුතුය.
(ආ). සාධාරණත්වය යටතේ සෑම හානියකටම ප්‍රතිකර්මයක් පවතී.

**(10 x 2 = ලකුණු 20)**

## <u>II කොටස - භාර නීතිය</u>

**මෙම කොටසින් ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

4. පහත අවස්ථානුගත කරුණු යටතේ වලංගු භාරයක් නිර්මාණය වන්නේදැයි සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර උචිත ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීරණ මගින් තහවුරු කරන්න.

(අ). මැටිල්ඩා තම දස හැවිරිදි දියණිය වන ප්‍රියාගේ ප්‍රතිලාභය වෙනුවෙන් සකස් කරන ලද භාරයේ භාරකරු ලෙස සිය පහළොස් හැවිරිදි පුත්‍රයා වන කවිදු පත් කිරීම.

(ආ). සුදත් සිය ළඟම ඥාතීන්ගේ ප්‍රතිලාභය උදෙසා සමාගමක කොටස් සහ නුවරඑළියෙහි පිහිටි තේ වත්තක් සිය හොඳම මිතුරා වන සමන්ට පැවරීම.

(ඇ). රාණි ඇගේ සහෝදරයාගේ දරුවන් වන අමාලි සහ නිමල්ගේ ප්‍රතිලාභය පිණිස භාරකරු ලෙස සිය සැමියා වන සිරිල්ව පත් කරමින්, නොතාරිස් පැවරුම්කරයකින් තොරව ප්‍රකාශිත භාරයක් සකස් කිරීමට අදහස් කිරීම.

(ඈ). නීලා මහරගම අපේක්ෂා රෝහල අසල පිහිටි ඉඩමක හිමිකාරිය වේ. රෝගීන් බැලීමට පැමිණෙන අමුත්තන්ට නොමිලේ වාහන නතර කිරීම සඳහා පහසුකම් සැලසීමට ඇය සිය ඉඩම "මනුසුව සංගමය" වෙත පැවරීම.

**(5 x 4 = ලකුණු 20)**

5. "අනුමිත භාරයක්, ඇතැම් කරුණුවලින් ප්‍රකාශිත භාරයකට ප්‍රතිවිරුද්ධ අන්තය ගනී. ප්‍රකාශිත භාරයක්, සිය දේපළේ ප්‍රතිලාභී අයිතිය පැවරීම සඳහා වූ අයිතිකරුගේ චේතනාවට බලාත්මකභාවය ලබා දෙන නමුත්, අනුමිත භාරයක් ඇතැම් විට අයිතිකරුවන්ගේ චේතනාවන්ට ඍජුවම පටහැනිව බලාත්මක කරනු ලැබේ."

~Lord Browne – *Wilkinson, Westdeutsche Landesbank Girozentrale V. Islington LBC* (1996) AC 669 at 705 D~

භාර ආඥාපනතේ ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාවය පරීක්ෂා කරන්න.

**(ලකුණු 20)**

6. ජුලියස්, ඩේවිඩ් සහ නිතයාගේ ප්‍රතිලාභය සඳහා භාරකරු ලෙස පිලිප් පත්කරමින් ප්‍රකාශිත භාරයක් පිහිටුවා ඇත. පිලිප්ගේ පහත ක්‍රියාකාරකම් සම්බන්ධව ඩේවිඩ් ඔබගෙන් නීතිමය උපදෙස් පතයි. භාරකරුවන්ගේ සහ අර්ථලාභීන්ගේ කාර්යයන්, බලතල සහ වගකීම් සම්බන්ධ උචිත ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩුතීන්දු ඇසුරින් ඔහුට උපදෙස් දෙන්න.

(අ). මහනුවර පිහිටි තේ වත්තක්ද භාරදේපළට ඇතුළත්ව ඇත. එම නිසා, තේ වත්තෙහි කටයුතු සොයා බැලීමට සිය කාර් රථයෙන් සෑම මසකම මහනුවරට ගමන් කිරීමට පිලිප්ට සිදුව ඇත. ඔහුගේ ගමන් වියදම භාරදේපළෙන් ලැබෙන ආදායමෙන් ආවරණය කර ගැනීමට ඔහු අදහස් කරයි.

(ආ). පිලිප් සෑම මසකම ජුලියස්ගේ බාලවයස්කාර දියණිය වන නිත්‍යාගේ අධ්‍යාපනය සඳහා ඩේවිඩ්ගෙන් විමසීමකින් තොරව භාරදේපළෙන් ලැබෙන ආදායමෙන් කොටසක් වෙන් කරයි.

(ඇ). භාර දේපළ සමානව ජුලියස්ගේ දරුවන් දෙදෙනා අතර බෙදිය යුතු බවට භාර සාධන පත්‍රයෙන් ප්‍රකාශ කර ඇත. නිත්‍යා, ඩේවිඩ්ට වඩා පිලිප්ට සමීප බැවින් පිලිප් භාර දේපළෙන් වැඩි කොටසක් නිත්‍යාට වෙන් කරයි.

(ඈ). පිලිප් ඔහුගේ සේවාවන් සහ පරිශ්‍රමයන් සඳහා වැටුපක්, භාර දේපළෙන් ලැබෙන ආදායමෙන් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

**(5 x 4 = ලකුණු 20)**

7. "පුණ්‍ය" යන නෛතික සංකල්පය ශ්‍රී ලංකා නීතිය සහ ඉංග්‍රීසි නීතිය තුළ අත්‍යාවශ්‍යයෙන්ම සමාන වුවද, භාවිතා කරනු ලබන පාරිභාෂික වචන වල වෙනනස්කම් නිරීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. අපගේ ව්‍යවස්ථාව සාමාන්‍යයෙන් ඇතැම් පැතිකඩයන් තුළ ඉංග්‍රීසි නීතියට වඩා වඩාත් පුළුල් වේ."

ශ්‍රී ලංකා නීතිය සහ ඉංග්‍රීසි නීතිය තුළ වලංගු පුණ්‍ය භාරයක අවශ්‍යතා ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාවය පරීක්ෂා කරන්න.

**(ලකුණු 20)**

8. පහත සඳහන් මාතෘකා හතර <u>**(04)**</u> යටතේ කෙටි සටහන් ලියන්න.

(අ). සීප්‍රේ මූලධර්මය
(ආ). සාධාරණත්ව ප්‍රතිකර්මයක් ලෙස යථා තත්ත්වයට පත් කිරීම
(ඇ). භාරය සහ ෆීතකොමිසම අතර වෙනස
(ඈ). 2018 අංක 06 දරණ භාර සංශෝධන පනතේ මූලික ලක්ෂණ

**(5 x 4 = ලකුණු 20)**

***--හිමිකම් ඇවිරිණි--***